දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

**සුවසිරිපාය**
**சுவசிரிபாய**
**SUWASIRIPAYA**

මගේ අංකය )
எனது இல )NCCP/GOSL/CPED/07/2023
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2 .08.2023
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் அமைச்சு
# Ministry of Health

---

චක්‍ර ලේඛ අංක : 02 - 118 / 2023

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ආයතන ප්‍රධානී,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

## ලෝක පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය - ඔක්තෝබර් 2023

ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර සුලබම පිළිකාව පියයුරු පිළිකාවයි. වසරකට කාන්තාවන්ගේ අළුතින් හඳුනාගන්නා පිළිකා වලින් 26% පමණ පියයුරු පිළිකා වේ. පිළිකා ලේඛන දත්ත වලට අනුව, 2020 දී නව රෝගීන් 5189 ක් හඳුනාගෙන ඇත. පසුගිය වසර 25 ක කාලය තුළ අළුතෙන් හඳුනා ගත් පියයුරු පිළිකා රෝගීන්ගේ සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කරයි.

පියයුරු පිළිකා ඇති රෝගීන් කල් ඇතිව හඳුනා ගැනීම, කඩිනම් රෝග විනිශ්චය, ප්‍රතිකාර ලබාදීම සහ පිළිකාව සමඟ දිවි ගෙවන රෝගීන් සඳහා ඇති නොයෙකුත් සේවාවන් පිළිබඳව ජනතාවගේ දැනුවත් බව වැඩි කිරීමේ අරමුණින් ලොව පුරා 'පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය' සෑම වසරකම ඔක්තෝබර් මාසයේදී සමරනු ලැබේ.

පියයුරු පිළිකාව කලින් හඳුනාගෙන මූලික අවස්ථාවේදී ප්‍රතිකාර කිරීම මගින් රෝගය සුව කර ගැනීමට ඇති හැකියාවද වැඩි වේ. ප්‍රතිකාරවල ඵලදායීතාවය ඉහළ නැංවීමට අමතරව, කලින් හඳුනා ගැනීම මගින් මූලික ශල්‍යකර්ම පමණක් සිදුකර ශරීර හැඩයට සිදුවන බලපෑම වළක්වා ගැනීමටත් වියදම් අඩු සරල ප්‍රතිකාර සඳහා යොමු වීමටත් අවස්ථාව සැලසේ.

පියයුරු පිළිකා කලින් හඳුනාගැනීම සඳහා ,

- පියයුරුවල ඇතිවිය හැකි අසාමාන්‍යතා සම්බන්ධව රෝග ලක්ෂණ හා සළකුණු පිළබඳ ජනතාවගේ දැනුම ඉහළ නැංවීම ('ඔබ විසින්, ඔබ වෙනුවෙන්') (ඇමුණුම I)
- ස්ව පියයුරු පරීක්ෂාව (SBE)
- සායනික පියයුරු පරීක්ෂාව (CBE)

දීප ව්‍යාප්ත සුවනාරී සායන හා සුවදිවි සායන මෙන්ම ඇතැම් ද්විතියික/තෘතියික රෝහල් තුළ පවත්වන 'පියයුරු සායන' මගින් පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීමේ සේවාව ලබා දේ (ඇමුණුම II). මෙය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය වන මැමෝග්‍රැෆි (ඇමුණුම III) පරීක්ෂාව සහ ව්‍යාධිවේදී පරීක්ෂණ සඳහා අවශ්‍ය වන පහසුකම්ද රට පුරා ව්‍යාප්තව පවතී.

මෙම වසරේ සිට ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් පියයුරු පිළිකා මර්දන කටයුතු ඉහළ නැංවීමට, පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම වැඩි කිරීමට සහ ජනතාව දැනුවත් කිරීම සඳහා අමතර පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම ආරම්භ කර ඇත. මෙම වසරේදී ආරම්භක කණ්ඩායම ලෙස වෘත්තීය රූපලාවන්‍ය ශිල්පීන් සම්බන්ධ කරගැනීමට අපේක්ෂා කෙරේ. මෙම සංකල්පය වෙනුවෙන් ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් විශේෂිත ප්‍රවර්ධන ද්‍රව්‍ය සකස් කර ඇත.

දිස්ත්‍රික් මට්ටමෙන් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, විශේෂඥ ප්‍රජා වෛද්‍යවරුන්, මාතෘ හා ළමා වෛද්‍ය නිලධාරීන් (MO/MCH), බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරීන් (MO/NCD) සහ දිස්ත්‍රික් අධීක්ෂණ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන්ගේ (RSPHNO) සහයෝගය ඇතිව, 2023 ඔක්තෝබර් මාසයේදී යෙදෙන ලෝක පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසයේදී ඔබගේ ආයතනය තුළ පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (MOH), ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානවල ආයතන භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් (MOIC/DMO) ඉල්ලා සිටිනු ලැබේ.

1. රෝහල් මට්ටමින් සහ සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශයකින්ම පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන්, දේශන, සාකච්ඡා පැවැත්විය යුතුය.

2. සුවනාරි සායන, 'සුව දිවි සායන', ශල්‍ය සායන, පියයුරු සායන, පිළිකා කලින් හඳුනාගැනීමේ මධ්‍යස්ථාන සහ ජංගම පිළිකා පරීක්ෂණ සායනවල, පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කළ යුතුය.

3. ඔක්තෝබර් මාසය තුළ පියයුරු පිළිකා වළක්වා ගැනීම පිළිබඳ පණිවිඩ හුවා දැක්වීම සඳහා, රෝහල්වල බාහිර රෝගී අංශ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් පවත්වනු ලබන සියළුම සායන ආදී හැකි සෑමතැනකම; රෝස පැහැති පටි, බැලූන් හෝ සුදුසු ආකර්ෂණීය සහ අඩු වියදම් සැරසිලි භාවිතා කරමින් අලංකාර කිරීම සුදුසුය. පියයුරු පිළිකාවෙන් සුව වූ අය හා මිය ගිය රෝගීන් සිහි කිරීමට මෙන්ම පියයුරු පිළිකාවෙන් ගැලවීම සඳහා දරණ උත්සාහයන් අගය කිරීම සඳහා අන්තර්ජාතිකව පිළිගෙන ඇති වර්ණය රෝස පැහැයයි. සිවිල් සමාජ සංවිධානවල සක්‍රීය සහභාගීත්වය තුළින් පෞද්ගලික අංශයට සහ රාජ්‍ය නොවන අංශයට මෙම මූලික ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය.

4. පියයුරු පිළිකා පිළිබඳ තොරතුරු සැපයීම සඳහා 'පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ ස්ථානයක්' හෝ "පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ හදිසි ඇමතුම් සේවාවක්" රෝහල්වල සහ අනෙකුත් සෞඛ්‍ය සේවා ආයතනවල පිහිටුවිය හැකිය. මෙහිදී, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් (PHNO) හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් වැනි සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩල, පියයුරු පිළිකා පිළිබඳ මහජනතාව අසන ප්‍රශ්න වලට පිළිතුරු දීමට අනුයුක්ත කළ හැක. එමෙන්ම අමතර තොරතුරු ලබා දීමට මේ සමඟ අප විසින් සපයා ඇති දැනුවත් කිරීමේ පත්‍රිකා භාවිතා කළ හැකිය.

5. ආයතනයේ ෆේස්බුක්/වෙබ් පිටු භාවිතා කරමින් හා **Whatsapp** හෝ **Viber** කණ්ඩායම් හරහා පියයුරු පිළිකා වැළැක්වීමේ සහ කලින් හඳුනා ගැනීමේ පණිවිඩය, සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරය කළ හැක. ඒ සඳහා ඔබට මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති දත්ත භාවිතා කළ හැකිය. මව් හවුල, මහිලා සමිති/ කාන්තා සමිති වැනි ප්‍රජා එකමුතු දිරිමත් කිරීමටත්, ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබා ගැනීමටත් මෙය භාවිතා කළ හැක උදා: **Rotary, Lions, Innerwheel, Zonta,** ආදිය.

6. පියයුරු පිළිකා පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීම සඳහා අමතර පාර්ශවයක් ලෙස හඳුනා ගෙන ඇති වෘත්තීය රූපලාවන්‍ය ශිල්පීන්ට මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ සහාය ලබා දී මෙම කාර්යය සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට කාරුණික වන්න. සෞඛ්‍ය ප්‍රවර්ධන ද්‍රව්‍ය මෙම චක්‍රලේඛය සමඟ ඩිජිටල් ආකාරයෙන් බෙදා දෙනු ඇත (ඇමුණුම IV).

ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් මේ වනවිටත් ලබා දී ඇති සෞඛ්‍ය අධ්‍යාපන ද්‍රව්‍ය උදා: බැනර්, ස්ව පියයුරු පරීක්ෂාව ඉගැන්වීම සඳහා ඇති ඩමියන් (දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට ලබා දී ඇත්නම්), ස්ව පියයුරු පරීක්ෂාව පිළිබඳ සැණපත් කට්ටල සහ අත් පත්‍රිකා , දැනුවත් කිරීමේ කටයුතු සඳහා භාවිතා කළ හැක. මෙම ජාතික ප්‍රයත්නය සඳහා ඔබගේ නායකත්වය, මග පෙන්වීම සහ ක්‍රියාකාරී සහභාගීත්වය බෙහෙවින් අගය කරමි.

ලෝක පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය - ඔක්තෝබර් 2023, සැමරීම සඳහා ඔබේ ආයතනය, දිස්ත්‍රික්කය විසින් සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශ වාර්තාවක් 2023 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ. සාරාංශ වාර්තාව විද්‍යුත් තැපෑල මගින් ද එවිය හැකිය: nccpmohsl@gmail.com.

..........................................................................

වෛද්‍ය අසේල ගුණවර්ධන

**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :
1. ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය තුමා
2. ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය තුමා
3. සියලුම පළාත් සෞඛ්‍ය අමාත්‍ය තුමන්
4. ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
5. අතිරේක ලේකම්, (වෛද්‍ය සේවා)
6. සියලුම නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වරුන්
7. අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩ සටහන, මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්යාංශය, බෝනොවෙන රෝග අංශය, සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකකය, ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය, පෞද්ගලික සෞඛ්‍ය සේවා සංවර්ධන